ලංකාදීප

2018 මාර්තු මස 07 වැනිදා බදාදා

# පාත්ෆයින්ඩර් චීන නව තානාපති හමුවී...



පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා මහජන චීන සමූහාණ්ඩුවේ මෙරට නව තානාපති චෙන්ග් ක්ෂුවාන් මහතා මුණ ගැසුණි.

චීන ශ්‍රී ලංකා සබඳතා හැට වසර සමරනු සඳහා පදනම හා චීනයේ ප්‍රකට ජාත්‍යන්තර සම්බන්ධතා ආයතනයක් සමඟ එකතු වී පාත්ෆයින්ඩර් පදනම පළ කරන ලද රටවල් දෙක ගැන අධ්‍යයන ලිපි ඇතුළත් කෘතියක පිටපතක්ද මෙහිදී පිළිගැන් වුණ අතර සහයෝගීතාව අරමුණු කරගෙන මෙම වසර තුළ සංවිධානය කර ඇති ආර්ථික හා සමාජයීය වැඩසටහන් ගැන ද මෙහිදී සාකච්ඡා කෙරිණි. පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක, විධායක අධ්‍යක්ෂ ලක්ෂ්මන් සිරිවර්ධන, ජ්‍යෙෂ්ඨ නියෝජිත ලලිත් වීරතුංග සහ අධ්‍යක්ෂ ආචාර්ය ජයනාත් කොළඹගේ යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.